EDB SRI LANKA

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

01 වෙළුම 02 කලාපය
2023 ජූනි

EDB Open Day වැඩසටහනින් අපනයන සඳහා උනන්දුවන නවක ව්‍යවසායකයන් සවිබල ගැන්වෙයි 03

කාබනික අපනයනකරුවන් ලියාපදිංචි වීමේ ක්‍රමවේදය 08

ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානය 09

ඊශ්‍රායල වෙළඳපොලේ නව අපනයන අවස්ථා 11






ප්‍රකාශනය :

අපනයන පුවත්ර් - මාසික තොරතුරු ප්‍රකාශනය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රකාශනයකි

මගපෙන්වීම :

ආචාර්ය කිංස්ලි බර්නාඩ්
මාලනී බද්දේගමගේ
අචිනි වීරවර්ධන

සංස්කාරක මණ්ඩලය :

උපුල් ගලප්පත්ති
නාලක මධුෂාන්
චන්දිම වන්නිආරච්චි
කේ.ඩී.දර්ශන

පිටු සැකසුම :


චන්දිම දොළපිහිල්ල

බෙදාහැරීම :

වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු අංශය

0112 300 724











# ලොව ජයගන්න හැටි දැනගන්න

ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ අභියෝග රැසකට පසුගිය සමයේ මුහුණ දුන්නේය. මේ වන විට අප ඒ අති දුෂ්කර කාල සීමාව පසුකර බලාපොරොත්තු තැබිය හැකි අනාගතයකට ප්‍රවේශ වෙමින් සිටින්නෙමු.

එහිදී රටේ ආර්ථිකය නැංවීමේ පළමු අභියෝගය රටට වැඩි වැඩියෙන් විදේශ විනිමය ගෙන එම බව අමුතුවෙන් කිව යුතු නොවන්නේය. එහිදී වැඩිම කාර්ය භාරයක් පැවරෙන්නේ අපනයන ක්ෂේත්‍රය වෙතටය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරය වී ඇත්තේ ඒ සඳහා සක්‍රියව මැදිහත් වීමය.

රටේ විදේශ විනිමය සංචිත ඉහළ නැංවීමට නම් දැනට සිදුකෙරෙන මෙරට අපනයන නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට අතිරේකව නව අපනයන කරුවන් ජනිත කිරීම හරහා වැඩි අපනයන ඉලක්කයක් සපුරා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වන්නේය.

අපනයන තත්වයට ගෙන යා හැකි ව්‍යවසායකයින් රැසක් මෙරට පුරා විසිරී ඇති බව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මේ වන විටත් හඳුනාගෙන ඇත්තේය. ඔවුන්ගේ නිෂ්පාදන වල ගුණාත්මක බව, තත්වය, ඇසුරුම්කරණය ඉහළ නැංවීම මගින් මෙන්ම ජාත්‍යන්තර වෙළඳ පොළට පිවිසීමේදී දැනුවත් විය යුතු කරුණු, නව වෙළඳ පොළවල් හඳුන්වා දීම මෙන්ම, නිෂ්පාදන අගය වැඩිකිරීමේ ක්‍රමවේද පිළිබඳවද ව්‍යවසායකයින් දැනුවත් කිරීම මෙහිදී කළ යුතුම දෙයක්ය.

අපනයන පුවත් මාසික තොරතුරු ප්‍රකාශනය හරහා අප උත්සාහ කරන්නේ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමය.

සංස්කාරක මණ්ඩලය

# EDB Open Day වැඩසටහනින් අපනයන සඳහා උනන්දුවන නව්‍ය ව්‍යවසායකයන් සවිබල ගැන්වෙයි




**අපනයන සඳහා උනන්දුවන තරුණ තරුණියන්ගේ සහභාගීත්වයේ වර්ධනයක් ... !**

නව්‍ය ව්‍යවසායකයන් අපනයනය සඳහා දිරිමත් කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රථම වරට පැවැත්වූ "EDB Open Day" එක්දින වැඩසටහන සාර්ථක අන්දමින් පසුගියදා අපනයන සංවර්ධන මණ්ඩලයේදී පැවැත්විණි. මේ සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් නව ව්‍යවසායකයන් දහසකට වැඩි සංඛ්‍යාවක් සහභාගී වූ අතර අපනයන ක්ෂේත්‍රය සඳහා උනන්දුවන තරුණ තරුණියන්ගේ සහභාගීත්වයේ වර්ධනයක් දක්නට ලැබිණි.

මුලින්ම අපනයන ක්ෂේත්‍රයට යොමුවන පිරිස් සඳහා අවශ්‍ය මූලික දැනුම ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුවූ අතර ඊට සමගාමීව එක් එක් ව්‍යවසායකයන්ට අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සමග "One-to-One Meetings" සාකච්ඡා කිරීමටද අවකාශය හිමිවිය.

මෙහිදී වැඩිදුරටත් අපනයන ක්‍රියා පටිපාටියණී කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන පිළිබඳ පැහැදිලි කිරීම්ණී නිෂ්පාදන වැඩිදියුණු කිරීමණී වෙළඳපොළ හඳුනා ගැනීමණී අපනයන සම්බන්ධතා වැනි සහභාගිවන්නන්ගේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද විවිධ ක්‍රියාකාරකම් සහ සේවාවන්. අනාගත අපනයනකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීමට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මාර්ගෝපදේශ සඳහා මගපෙන්වීම් මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ලබාදෙන සියලුම සේවාවන් පිළිබඳ අදහස් ලබා ගැනීමට සහ අදාළ නිලධාරීන් එකම ස්ථානයක හමුවීම සඳහා අවකාශය ද "EDB Open Day" මගින් සැලසිණී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායක ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතාණී අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) මාලිනී බද්දේගමගේ මහත්මිය ප්‍රමුඛ අපනයන සංවර්ධන මණ්ඩලයේ සියලුම නිලධාරීන් වැඩසටහන සඳහා සම්පත් දායකත්වය සැපයීය.






“මම නිමි ඇඳුම් නිෂ්පාදනය කරනවා. දැනට එක්ස්පෝර්ට් මාර්කට් එකට යන්න තමයි මගේ තියෙන එකම බලාපොරොත්තුව. මෙතනට ආවෙ එක්ස්පෝර්ට් මාර්කට් එකට යන විදිය ගැන අදහසක් ගන්න.”




“ලංකාව මුහුණ දීලා තියෙන ආර්ථික අපහසුතාවයෙන් ගොඩ එන්න තියෙන එකම ක්‍රියාමාර්ගය තමයි අපි පුළුවන් තරම් අපේ අපනයනය දිරිගන්වන එක. EDB ආයතනය අද දිනයේදී කරන්න යන වැඩපිළිවෙල මං හිතන්නෙ ඉතාමත්ම වැදගත්, ඉදිරි ආර්ථිකයේ ප්‍රවර්ධනය සඳහා.”




“ගාල්ලෙ ඉඳන් ආවෙ. මම කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක්. මම විවිධ වර්ගවල හඳුන්කූරු නිෂ්පාදනය කරනවා. ලිපි ලේඛන සකස් කිරීමේ ඉඳන් නීතිමය පැත්ත□ ඊ-කොමස් පැත්ත වගේ ගොඩාක් වපසරිය අද දින EDB Open Day එකෙන් දැනුම ලබා දුන්නා.”




අපනයන ක්ෂේත්‍රයට යොමුවන පිරිස් සඳහා අවශ්‍ය මූලික දැනුම ලබාදීම





අපනයන ක්ෂේත්‍රයට යොමුවන පිරිස් සඳහා අවශ්‍ය මූලික දැනුම ලබාදීම





එක් එක් ව්‍යවසායකයන් අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සමඟ කළ (One-to-One Meetings) සාකච්ඡා











# කාබනික අපනයනකරුවන්
## ජාතික කාබනික පාලන ඒකකයේ ලියාපදිංචි වීමේ ක්‍රමවේදය




කාබනික කෘෂිකාර්මික භෝග වගාකරන, සකස් කිරීමේ සහ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන, අපනයනය කරන සහ රසායනාගාර කටයුතුවල නියැලෙන සියලුම කාබනික කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් නිල වශයෙන් ලියාපදිංචි කළ යුත්තේ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ පිහිටුවා ඇතිණී ජාතික කාබනික පාලන ඒකකයේය. මේ සඳහා වන ලියාපදිංචි කටයුතු වඩාත් කාර්යක්ෂම අයුරින් සිදු කිරීම සඳහා වන අන්තර්ජාල ලියාපදිංචි ක්‍රමවේදය හඳුන්වාදීම සහ ඒ පිළිබඳ වන කටයුතු පැහැදිලි කෙරෙමින් අන්තර්ජාල සැසියක් පසුගිය ජූනි 01 වනදා පැවැත්විණී.

මීට පෙර ඒ සඳහා වූයේ පැමිණ ලියාපදිංචි වීමේ ක්‍රමවේදය වන අතර මේ වන විට ඒ සඳහා මාර්ග ගත ක්‍රමවේදය ආදේශ කොට තිබේ. කාබනික කෘෂිකාර්මාන්තයට සම්බන්ධ වගාකරුවන්, අපනයනකරුවන්, ආනයන කරුවන්, වෙළඳුන්, නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, සහතික කිරීමේ ආයතන, පරීක්ෂණ ආයතන සහ කාබනික කෘෂිකාර්මික නිෂ්පාදනවල රසායනාගාර ඇතුළු කාබනික කෘෂිකර්මය හා සම්බන්ධ සියලු ආයතන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ පිහිටුවා ඇති ජාතික කාබනික පාලන ඒකකයේ (NOCU) ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ පද්ධතිය වෙත පිවිස NOCU ගිණුමක් නිර්මාණය කරගත යුතුය. පහත දැක්වෙන්නේ ගොවියෙකු ලෙස ලියාපදිංචි වීමේ පියවර වන අතර අවසානයේ දක්වා ඇති වීඩියෝ සබැඳිය ඔස්සේ වැඩි විස්තර ලබා ගත හැකිය.

ජාතික කාබනික පාලන ඒකකයේ වෙබ් අඩවියට (https://www.nocu.lk) පිවිසීමෙන් ලියාපදිංචිය ආරම්භ කළ හැකිය. එයට ප්‍රවේශ වී Register Now බොත්තම ක්ලික් කරන්න. ඉන් පසු ඔබගේ සම්පූර්ණ නම, ඊමේල් ලිපිනය, දුරකථන අංකය ඇතුළත් කරන්න. ලියාපදිංචි වන කාණ්ඩය දී තිබෙන ලැයිස්තුවෙන් තෝරා ගන්න. අවශ්‍ය පරිශීලක නාමයක් සහ මුරපදයක් යොදන්න. ඔබ පද්ධතියට පිවිසීමේදී මෙම පරිශීලක නාමය සහ මුරපදය භාවිත කළ යුතුය. ඔබගේ සියලු තොරතුරු එක් කොට නියමයන් සහ කොන්දේසිවලට එකඟතාවය ලබා දුන් පසු Create Account අයිකනය ක්ලික් කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපෑලට සත්‍යාපන කේතයක් ලැබෙනු ඇත. එය ඇතුළත් කොට ඉදිරියට යන්න. Go to Dashboard බොත්තම ක්ලික් කිරීමෙන් පසු අයදුම්පත් පිටුවට පිවිසිය හැකිය.

අයදුම්පත් පිරවීමේදී පළමු පිටුවේ ඔබේ ගොවිපොළ විස්තර ඇතුළත් කළ යුතුය. දෙවැනි පිටුව ඇමතිය යුතු පුද්ගලයන්ගේ (contact person details) පිටුවයි. මෙහිදී ඔබේ ඇමතිය යුතු පුද්ගලයන් ලියා-පදිංචි කර ගත හැකිය. තුන්වන පිටුව කාබනික සහතිකවල විස්තර ඇතුළත් කිරීමේ පිටුවයි. ඊට අදාළ සියලුම විස්තර මෙහි ඇතුළත් කළ යුතුය. ඉන් පසු සිව්වන පිටුව සඳහා ජාතික කාබනික පාලන ඒකකයට ඉදිරිපත් කළ යුතු ඕනෑම අමතර ප්‍රකාශයක් හා ලේඛනයක් එක් කළ හැකිය (මේ කොටස පිරවීම අනිවාර්ය නොවේ). ඉදිරි පියවරට පිවිසි පසුණී ගොවියෙකු ලෙස ලියාපදිංචි වීමට අමතරව අනෙකුත් කාණ්ඩ යටතේ (අපනයනකරුවෙක්, ආනයනකරු වෙක, වෙළෙන්දෙක්) ලියාපදිංචි වීම සඳහා ද අවකාශ සැලසේ. Dashboard වෙත ගොස් view certificate වෙත පිවිසීමෙන් ඔබේ කාබනික සහතිකය බලාගත හැකිය.

මේ පිළිබඳ වැඩිදුර විස්තර නැරඹීම සඳහා පහත යූටියුබ් සබැඳිය වෙත පිවිසෙන්න https://www.youtube.com/watch?v=1Fsc6vDfBxE කාබනික සහතික ලබා ගැනීමණී ලියාපදිංචිය ඇතුළු සියලුම විස්තර සඳහා උපදෙස් ලබා ගැනීමට 011 2300717 අමතන්න.

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 29 වැනි වගන්තිය යටතේ 2014 ජූලි 11 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් අංක 1870/ 71 අනුව අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ජාතික කාබනික පාලන ඒකකය ස්ථාපිත කොට ඇති අතර, එහි අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුළ කාබනික කෘෂිකාර්මික භෝග නිෂ්පාදනයණී සහතික කිරීම හා අලෙවියට අදාළ සියලු කටයුතු අධීක්ෂණය කරමින් ආනයනය සහ අපනයනය කරනු ලබන සියලුම කාබනික නිෂ්පාදනවල විශ්වාසනීයත්වය සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීමයි.

මෙම වැඩසටහන සඳහා තාක්ෂණික සහය ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා ජර්මානු සංගමය (GIZ) සහ ජාත්‍යන්තරන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) යන ආයතන විසින් ලබා දුන් අතර මූල්‍ය අනුග්‍රහය ජර්මානු ෆෙඩරල් ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය (BMZ) සපයන ලදී.

### අපනයනකරුවන්ගේ අභිනන්දන උළෙල

# ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානය




ජනාධිපති අපනයන සම්මාන උළෙල 2023 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත්තේය. මෙවර ප්‍රධාන ආරාධිතයා වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මෙම උළෙල මෙවර සංවිධානය කරනු ලබන්නේ 25 වැනි වරටය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජනාධිපති අපනයන සම්මාන සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලාංකික අපනයන කරුවන්ට පුවත්පත් හා ජනමාධ්‍ය හරහා විවෘත දැන්වීමක් කර ඇති අතර මෙම සම්මාන ප්‍රදානය මගින් බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය උදෙසා ඉමහත් සේවයක් ඉටු කරන ලද අපනයන කරුවන් ඇගයීමයි.

අපනයන ක්ෂේත්‍රයට සහ ආර්ථික ප්‍රගමනයට සුවිශේෂී දායකත්වයක් ලබාදුන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් වෙත එහිදී ජනාධිපතිතුමන් විසින් ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානය කරනු ඇත්තේය. එම සම්මාන වනාහී ශ්‍රී ලංකාව තුළ අපනයනකරුවෙකු ලබන උසස්ම සම්මානය වන්නේය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජනාධිපති අපනයන සම්මාන 1981 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර මේ දක්වා සම්මාන උළෙල 24ක් සංවිධානය කොට ඇත. 25 වන ජනාධිපති අපනයන සම්මාන උළෙල මේ වසරේ නොවැම්බර් මස 23 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර මේ සඳහා ගරු කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යවරුන්ණී රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, සුබ පතන්නන් මෙන්ම අපනයනකරුවන් විශාල පිරිසක් සහභාගී වීමට නියමිතය.

2021/22 සහ 2022/23 මූල්‍ය වර්ෂ දෙක සඳහා ශ්‍රී ලංකාවේ හොඳම අපනයන කරුවන් ඇගයීම සඳහා මෙවර සම්මාන උළෙල පැවැත්වේ. සෑම මූල්‍ය වර්ෂ යක් සඳහාම සමස්ත සම්මාන 13ක් සහ නිෂ්පාදන සහ සේවා අංශයේ සම්මාන 51ක් සමඟින් ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ මෙම සම්මාන පිරිනැමේ. තවද්, අයදුම් කරුවන්ගේ කාර්ය සාධනය මත විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සුදුසුකම් ලත් අංශ සඳහා මෙවර සම්මාන ලාභීන් තෝරා ගැනීම සිදුකරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විශ්‍රාමික විනිසුරු-වරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් කීර්තිමත් විනිශ්චය මණ්ඩලයක් විසිනි.

නව රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ අපනයන පුළුල් කිරීම සඳහා නව උපායමාර්ග ක්‍රියාවට නංවා ඇති අතර අපනයන ආදායම ඉදිරි වර්ෂවලදී සැලකිය යුතු ලෙස වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුවණී  සමස්ත සම්මාන සැලසුම් කිරීමේ දී වෙළෙඳපොල විවිධාංගීකරණය, භාණ්ඩ විවිධාංගීකරණය, අපනයන නවෝත්පාදන, භාණ්ඩ හා සේවා සඳහා අගය එකතු කිරීම, දේශීය සන්නාම ලොවට හඳුන්වාදීම, අපනයන තිරසාරබව සදහා ගනු ලබන ක්‍රියාමාර්ග, අපනයනය සදහා  ප්‍රාදේශීය අගය දාමයන්ගේ දායකත්වය යනාදිය සලකා බලන ලදී.




තවද, අපනයන ඉපැයීම් පමණක් නොව, අපනයන සඳහා අගය එකතු කිරීමණී රැකියා උත්පාදනය, අපනයන ඉපැයීම් වර්ධනය, අපනයන ආදායම මෙරටට ගෙන්වා ගැනීම, පාරිසරික තිරසාරභාවය සහ ආයතනික සමාජ වගකීම් වැනි තවත් නිර්ණායක කිහිපයක් ඇගයීමට ලක් කර ඇති බැවින් මෙවර ආංශික සම්මාන තෝරා ගැනීම වඩාත් තරගකාරී වනු ඇත. එමෙන්ම, කුසලතා සම්මාන පිරිනැමීම  හරහා තරගකාරී අපනයනකරුවන් වැඩි පිරිසක් සම්මානයට පාත්‍ර කිරීමට ද කටයුතු යොදා ඇත.

ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී සම්මානලාභීන්ට කුසලානයක් සහ සහතිකයක් පිරිනැමේ. මෙම දිනයේ සිට වසර 3 ක කාලයක් සඳහා ජනාධිපති අපනයන සම්මාන ලාංඡනය අලෙවිකරණ මෙවලමක් ලෙස භාවිතා කිරීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

25 වැනි ජනාධිපති අපනයන සම්මාන උළෙල ආයෝජන ප්‍රවර්ධන ගරු  රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමන්ගේ සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්. නයිමුදීන් මහතාගේ උපදෙස් හා  මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබයි.


# ඊශ්‍රායල වෙළඳපොලේ නව අපනයන අවස්ථා පිළිබඳ ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කෙරේ



ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය. ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ ආසියා වාණිජ මණ්ඩලය එක්ව ශ්‍රී ලාංකේය අපනයනකරුවන්ට තොරතුරු ලබාදීම සඳහා අන්තර්ජාල සැසියක් පසුගියදා සංවිධානය කළ අතර ශ්‍රී ලංකාවෙන් සහ ඊශ්‍රායලයෙන් පුද්ගලයින් 275 කට අධික පිරිසක් ඊට සහභාගී වූහ.

කෙටිකාලීන අපනයන ප්‍රවර්ධන උපාය මාර්ග යක් ලෙස ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීම සහ ඊශ්‍රායල වෙළඳපොළේ නව ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කිරීම සඳහා වේදිකාවක් සැපයීම මෙම සැසියේ අරමුණ විය. ඊශ්‍රායල වෙළඳපොළට ප්‍රවේශ වීම, තත්ත්ව ප්‍රමිති අවශ්‍යතා, ආනයන සහ අපනයන ක්‍රියා පටිපාටි, ඊශ්‍රායලයේ බදු ක්‍රමය, නීතිමය අවශ්‍යතා, වෙළඳ විභවය සහ ඊශ්‍රායල වෙළඳපොළට ඇතුළු වීම සඳහා වන කොන්දේසි පිළිබඳ අවබෝධයක් මෙම සැසිය මඟින් ලබා දෙන ලදි.

පොල් නිෂ්පාදනය, තේ සහ ඖෂධ තේ, වියළි පලතුරු, නැවුම් සහ ටින් කළ මාළු, මැණි- ක් හා ස්වර්ණාභරණ, නිමි ඇඟලුම්, යට ඇඳුම් නිෂ්පාදන, ඛනිජ ජලය, හකුරු සහ මී පැණි, කුරුඳු, පෝසිලේන් නිෂ්පාදන සහ මෘදුකාංග සංවර්ධනය වැනි ක්ෂේත්‍ර කෙරෙහි ඊශ්‍රායල ගැනුම්කරුවෝ උනන්දුවක් දැක්වූහ.




මෙම දැනුවත් කිරීමේ සැසිය සඳහා ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති එම්.එච්.එම්. නිමල් බණ්ඩාර මහතා සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතා සහභාගී වූ අතර මෙම සංවාදය දිගටම කරගෙන යාමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් ඉදිරියේදී තවත් වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමටත් එකඟතාවය පළ කරන ලදී.

ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකා අපනයනකරුවන් ඔවුන්ගේ ඊශ්‍රායල ගැනුම්කරුවන් සමඟ සම්බන්ධ කිරීම අරමුණු කරගනිමින් අනාගතයේ දී විවිධ ක්ෂේත්‍ර සඳහා විශේෂිත මුහුණට මුහුණ ව්‍යාපාරික හමුවීම් සහ අමතර ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට අපනයන සංවර්ධන මණ් ඩලය කටයුතු කරනු ඇත.


# 2023 මැයි මාසයේ ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය



2023 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී, ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 989.7 දක්වා 16.6% කින් වැඩි විය. කෙසේ වෙතත්, එය 2022 මැයි මාසයට සාපේක්ෂව 5.59% ක අඩුවීමකි.

විශේෂයෙන්ම ඇඟලුම් සහ රෙදිපිළි, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රධාන අපනයන නිෂ්පාදනවල පෙන්නුම් කරන සෘණාත්මක ප්‍රවණතා හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයනයේ පහත වැටීමේ ප්‍රවණතාව තවදුරටත් පවතී.

**රූපය 1: මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය 2020- මැයි, 2023**




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**2023 මැයි මාසයේ ප්‍රධාන අපනයන**

වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 12%ක් වූ තේ අපනයන ආදායම, 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 116.33ක් දක්වා 24.16% කින් වැඩි විය. තේ පැකට් අපනයනයෙන් ලද ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 56.58 දක්වා 25.76% කින් වැඩි විය. මීට අමතරව, වායුමය සහ රබර් ටයර් සහ ටියුබ් (6.82%) අපනයනයේ ධනාත්මක කාර්ය සාධනය සමඟින්, රබර් සහ රබර් නිම් නිෂ්පාදනවලින් අපනයන ආදායම 2023 මැයි මාසයේදී 0.20% කින් ඇමරිකානු ඩොලර් මිලියන 76.84 දක්වා ඉහළ ගොස් ඇත. කුළුබඩු සහ සගන්ධ තෙල් අපනයන ආදායම 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 27.13 දක්වා 26.24% කින් වැඩි විය. කුරුඳු අපනයන ආදා-යම 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 14.87 දක්වා 27.20% කින් වැඩි විය.

මීට අමතරවණි පරිවරණය කරන ලද වයර් (4.50 %), අනෙකුත් විදුලි සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන (1.7 %) අපනයන්හි ශක්තිමත් කාර්ය සාධනයක් සමඟින් විදුලි සහ ඉලෙක්ට්‍රොනික උපාංගවල අපනයන ඉපැයීම් 2023 මැයි මාසයේදී 5.0% කින් ඇමරිකානු ඩොලර් මිලියන 43.90 දක්වා වැඩි විය. මුහුදු ආහාර අපනයන ආදායම 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී ඇමෙරිකා-නු ඩොලර් මිලියන 22.98 දක්වා 36.54% කින් වැඩි විය. ශීත කළ මාළු (20.7 %), නැවුම් මාළු (2.86 %) සහ ඉස්සන් (76.21%) අපනයනයේ ශක්තිමත් කාර්ය සාධනය මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය තවද, විසිතුරු මත්ස්‍ය අපනයන ආදායම 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2.35 දක්වා 85.04% කින් වැඩි විය.

2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපනයන වටිනාකම 39.21% කින් ඇමරිකානු ඩොලර් මිලියන 132.25 දක්වා ඉහළ යනු ඇතැයි ගණන් බලා ඇත. මීට අමතරව, මූල්‍ය සේවා අපනයනවල වටිනාකම 2022 මැයි මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේදී 8.8% කින් ඉහළ යනු ඇතැයි ගණන් බලා ඇත.

**වගුව 1: නිෂ්පාදන අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| අපනයන භාණ්ඩ | ජන-මැයි 2022 | ජන-මැයි 2023 | % වර්ධනය (22-23) | මැයි 2022 | මැයි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|
| ඇඟලුම් සහ රෙදිපිළි | 2400.63 | 2024.68 | -15.66 | 482.68 | 412.43 | -14.55 |
| තේ | 460.90 | 524.00 | 13.69 | 93.69 | 116.33 | 24.16 |
| රබර් ආශ්‍රිත නිෂ්පාදන | 414.27 | 375.87 | -9.27 | 76.69 | 76.84 | 0.20 |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන | 350.03 | 280.85 | -19.76 | 70.59 | 66.66 | -5.57 |
| දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ | 115.04 | 156.66 | 36.18 | 16.85 | 31.43 | 86.53 |
| ඉලෙක්ට්‍රොනික සහ ඉලෙක්ට්‍රොනික සංරචක | 188.52 | 210.7 | 11.77 | 41.81 | 43.89 | 4.97 |
| කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන | 128.61 | 149.74 | 16.43 | 21.49 | 27.13 | 26.24 |
| සැකසූ ආහාර පාන වර්ග | 164.63 | 174.59 | 6.05 | 32.16 | 44.29 | 37.72 |
| මුහුදු ආහාර | 105.77 | 114.49 | 8.24 | 16.83 | 22.98 | 36.54 |
| විසිතුරු මසුන් | 7.10 | 11.05 | 55.63 | 1.27 | 2.35 | 85.04 |
| එළවළු | 9.74 | 12.40 | 27.31 | 1.76 | 2.70 | 53.41 |
| පළතුරු | 12.83 | 18.12 | 41.23 | 2.33 | 4.22 | 81.12 |
| වෙනත් අපනයන බෝග | 34.11 | 27.54 | -19.26 | 10.83 | 13.50 | 24.65 |
| මල් සහ ශාක පත්‍ර | 6.04 | 6.32 | 4.64 | 1.11 | 1.31 | 18.02 |
| බෝට්ටු නිෂ්පාදන | 5.25 | 12.04 | 129.33 | 0.14 | 0.21 | 50.00 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 72.15 | 162.25 | 124.88 | 7.09 | 21.89 | 208.74 |
| වෙනත් | 797.76 | 574.69 | -27.96 | 170.98 | 101.54 | -40.61 |
| මුළු වෙළඳ භාණ්ඩ අපනයනය | **5,273.38** | **4,835.99** | **-8.29** | **1,048.3** | **989.7** | **-5.59** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 2: ඉහළම අපනයන ගමනාන්ත 15 හි වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| | රට | ජන-මැයි 2022 | ජන-මැයි 2023 | % වර්ධනය (22-23) | මැයි 2022 | මැයි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|---|
| 1 | එක්සත් ජනපදය | 1,364.08 | 1140.70 | -16.38 | 266.42 | 225.80 | -15.25 |
| 2 | එක්සත් රාජධානිය | 411.62 | 352.32 | -14.41 | 78.22 | 66.58 | -14.88 |
| 3 | ඉන්දියාව | 364.99 | 345.55 | -5.33 | 82.51 | 78.10 | -5.34 |
| 4 | ජර්මනිය | 303.55 | 244.41 | -19.48 | 56.20 | 50.69 | -9.80 |
| 5 | ඉතාලිය | 243.86 | 259.19 | 6.29 | 51.45 | 61.84 | 20.19 |
| 6 | නෙදර්ලන්තය | 161.58 | 137.45 | -14.93 | 31.18 | 31.15 | -0.10 |
| 7 | කැනඩාව | 144.76 | 131.75 | -8.99 | 28.70 | 28.48 | -0.77 |
| 8 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 109.52 | 155.42 | 41.91 | 20.34 | 18.32 | -9.93 |
| 9 | බෙල්ජියම | 122.07 | 91.51 | -25.03 | 27.04 | 18.86 | -30.25 |
| 10 | ප්‍රංශය | 103.68 | 104.51 | 0.80 | 19.95 | 24.69 | 23.76 |
| 11 | ඕස්ට්‍රේලියාව | 96.15 | 93.53 | -2.72 | 18.13 | 19.81 | 9.27 |
| 12 | චීනය | 98.29 | 103.24 | 5.04 | 18.96 | 23.48 | 23.84 |
| 13 | ජපානය | 74.97 | 83.70 | 11.64 | 12.79 | 22.89 | 78.97 |
| 14 | බංග්ලාදේශය | 98.15 | 85.69 | -12.69 | 18.61 | 17.12 | -8.01 |
| 15 | මෙක්සිකෝව | 67.05 | 71.81 | 7.10 | 10.35 | 15.05 | 45.41 |
| | වෙනත් වෙළඳපොළ | 1,509.06 | 1,435.21 | -4.89 | 307.45 | 286.84 | -6.70 |
| | **එකතුව** | **5,273.38** | **4,835.99** | **-8.29** | **1,048.3** | **989.70** | **-5.59** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 3: කලාපය අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| රට | ජන-මැයි 2022 | ජන-මැයි 2023 | % වර්ධනය (22-23) | මැයි 2022 | මැයි 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|
| එක්සත් ජනපදය | 1,364.08 | 1,140.70 | -16.38 | 266.42 | 225.80 | -15.25 |
| යුරෝපා සංගමය (EU) එක්සත් රාජධානිය හැර | 1,190.92 | 1,072.06 | -9.98 | 233.98 | 236.98 | 1.28 |
| දකුණු ආසියාව | 540.04 | 504.15 | -6.65 | 114.75 | 111.77 | -2.60 |
| අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) | 294.70 | 349.69 | 18.66 | 68.78 | 72.30 | 5.12 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් | 130.37 | 142.13 | 9.02 | 26.26 | 26.5 | 0.91 |
| අප්‍රිකානු රටවල් | 113.56 | 129.85 | 14.34 | 19.07 | 23.63 | 23.91 |
| මැද පෙරදිග රටවල් (සයිප්‍රසය සහ ඊජිප්තුව හැර) | 79.36 | 106.12 | 33.72 | 12.24 | 25.06 | 104.74 |
| වෙනත් | 1,560.35 | 1,391.29 | -10.83 | 306.80 | 267.66 | -12.76 |
| **මුළු වෙළඳ භාණ්ඩ අපනයනය** | **5,273.38** | **4,835.99** | **-8.29** | **1,048.3** | **989.7** | **-5.59** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**සේවා අපනයනය**

2023 ජනවාරි සිට මැයි දක්වා කාලය සඳහා සේවා අපනයනවල ඇස්තමේන්තුගත වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 904"58 ක් වූ අතර එය 2022 අනුරූප කාලපරිච්ඡේදයට වඩා 12.07% ක වැඩිවීමක් වනු ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර ඇති සේවා අපනයන තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (ICT-BPM), ඉදිකිරීම්හී මූල්‍ය සේවා, ප්‍රවාහන සහ සැපයුම්වලින් සමන්විත වේ.

ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් අංශය
2023.06.26

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු අංශය,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
අංක 42 නවම් මාවත,
කොළඹ 02,
ශ්‍රී ලංකාව.

දුරකථන : +94-11-230-0705/11
ෆැක්ස් : +94-11-230-0676

ඊමේල් : tfti@edb.gov.lk
වෙබ් : www.srilankabusiness.com